# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 99955
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


27.10.2011

**මාධ්‍ය නිවේදනය.**

මාලඹෙහි පිහිටුවා ඇති නීති විරෝධී වෛද්‍ය උපාධි ප්‍රධානය කරන ආයතනය වෛද්‍ය ක්ෂේත්‍රයේ සියලු සාරධර්ම පමණක් නොව, රටෙහි පිළිගත් නීති රාමුවද බිඳ දමමින් කටයුතු කරන ආකාරය අපට මේ වන විට පෙනී යයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙතද මෙම ආයතනයෙහි සිසුන් වශයෙන් බැඳී ඇති පිරිස් වෙතද මෙම ආයතනය විසින් ලබා දී ඇති සියලුම ලිපි ලේඛනවල ලිපි ශීර්ෂ සහ අත්සන් ව්‍යාජ ඒවා බවට දැඩි සැක සහිත තත්වයක් මතුවී ඇත. මෙම ලිපි ලේඛන මෙම ආයතනයට සම්බන්ධ සිසුන්, දෙමව්පියන් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව රැවටීමේ අදහසින් සකස්කර ඇති ලේඛන බවට අප වෙත තොරතුරු ලැබී ඇත.

මේ සම්බන්ධව කඩිනමින් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා එයට අදාළ වංචනිකයන් නීතියේ රැහැනට හසුකර දියයුතු බව අපි අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමු. මෙය සමාජයේ යහපැවැත්මටත් වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනයටත් හේතුවනු ඇති බව පෙන්වා දෙමු.

ස්තුතියි.

වෛද්‍ය චන්දික එපිටකඩුව.
ලේකම්.